# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අමු / වියළි සලාක, සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත් හඳුනා ගැනීමේ අංකය : S&T/3/Dry Ration/ Fresh Ration/ 2019 (08)

1.0 ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන් අමු ආහාර, වියළි ආහාර සහ සකස් කළ ආහාර ප්‍රසම්පාදනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කඳවුරු සඳහා පහත සඳහන් ප්‍රවර්ගයේ ආහාර අයිතමයන් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනයන්, නිෂ්පාදකයින්, සමාගම් සහ සීමිත වගකීම් සහිත සමාගම් සහ අනෙකුත් වෙළඳ ආයතන වෙතින් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ. සැපයුම් කාලය 2019 ජනවාරි 01 වෙනි දින සිට 2019 දෙසැම්බර් 31 වෙනි දින දක්වා වේ.

1.1 **සේවා ස්ථාන සමූහ සමග අදාළ ප්‍රවර්ගයන්**

| සේවා ස්ථානය | | | කාණ්ඩය |
|---|---|---|---|
| | A කාණ්ඩය - හමුදා කඳවුර | | |
| 1.1.1 අඹේපුස්ස | 1.1.30 කොක්එළිය | 1.1.59 පූනානි | සියලුම අමු ආහාර වර්ග (එළවළු, පලතුරු, මාළු, මස්/ ශීත කළ ආහාර, ලෙලි ගසන ලද පොල්, බිත්තර (කිකිළි) කිරි නිෂ්පාදන |
| 1.1.2 අයියාකච්චි | 1.1.31 කොස්ගම | 1.1.60 පුත්තලම | |
| 1.1.3 අම්පාර | 1.1.32 කොත්මලේ | 1.1.61 පුදුකුඩුඉරුප්පු | |
| 1.1.4 අකුරේගොඩ | 1.1.33 කෝමාරිය | 1.1.62 රන්ටැඹේ (රන්දෙනිගල) | |
| 1.1.5 බදුල්ල | 1.1.34 කුරුණෑගල | 1.1.63 සේනපුර | |
| 1.1.6 බටලන්ද | 1.1.35 කුරුවිට | 1.1.64 සිංහපුර (වැලිකන්ද) | |
| 1.1.7 බූස්ස | 1.1.36 කිරංචි | 1.1.65 සුංගාවිල | |
| 1.1.8 බුත්තල | 1.1.37 කටුබැද්ද | 1.1.66 තන්තිරිමලේ | |
| 1.1.9 දෙහිඅත්තකණ්ඩිය | 1.1.38 කුකුලේගඟ | 1.1.67 තාරාවීකුලම් | |
| 1.1.10 දේවහුව | 1.1.39 ලක්ෂපාන | 1.1.68 ත්‍රිකුණාමලය | |
| 1.1.11 දිගන (මාබෙරියතැන්න) | 1.1.40 මාදම්පේ | 1.1.69 තුනුක්කායි | |
| 1.1.12 දෙඹගොඩ | 1.1.41 මැදවච්චිය | 1.1.70 උඩවලවේ | |
| 1.1.13 දඹුල්ල (ඉනාමළුව) | 1.1.42 මාදුරුඔය | 1.1.71 උකුවෙල | |
| 1.1.14 ඇඹිලිපිටිය | 1.1.43 මාන්කුලම | 1.1.72 ඌව කුඩාඔය | |
| 1.1.15 ගජසිංහපුර | 1.1.44 මත්තේගොඩ | 1.1.73 වව්නියාව | |
| 1.1.16 ගනේමුල්ල | 1.1.45 මන්නාරම | 1.1.74 වාකරෙයි | |
| 1.1.17 හොරොව්පතාන | 1.1.46 මාතර | 1.1.75 වාලච්චේනෙයි | |
| 1.1.18 ඉපලෝගම | 1.1.47 මයුරාපුර | 1.1.76 වරණී | |
| 1.1.19 යාපනය | 1.1.48 මොරවැව | 1.1.77 වීරවිල | |
| 1.1.20 ජයන්තිගම | 1.1.49 මහව (බලල්ල) | 1.1.78 වැලිකන්ද | |
| 1.1.21 කලාඔය | 1.1.50 නෙදුන්කේර්නි | 1.1.79 වෙල්ලන්කුලම් | |
| 1.1.22 කල්ලඩි | 1.1.51 නාවුල | 1.1.80 වෙල්ලන්කුලම් (වව්නියාව) | |
| 1.1.23 කල්ලාර් | 1.1.52 නුවරඑළිය | 1.1.81 වැල්ලවාය | |
| 1.1.24 කඹුරුපිටිය | 1.1.53 ඔඩ්ඩුසුඩ්ඩාන් | 1.1.82 වෙත්තලකර්නි | |
| 1.1.25 කතරගම | 1.1.54 පදවිපරාක්‍රමපුර | 1.1.83 වේයන්ගොඩ | |
| 1.1.26 මහනුවර | 1.1.55 පැලවත්ත | 1.1.84 විශ්වමඩු | |
| 1.1.27 කටුනායක | 1.1.56 පේදුරුතුඩුව | 1.1.85 යාල පලටුපාන | |
| 1.1.28 කෑගල්ල | 1.1.57 පූනරින් | | |
| 1.1.29 කොහොඹගස්හන්දිය | 1.1.58 පාන්ගොල්ල | | |

1.2

| B කාණ්ඩයේ - ප්‍රවර්ගය - අමු ආහාර වර්ග | ප්‍රවර්ගය - අමු ආහාර |
|---|---|
| 2.2.1 පනාගොඩ | (i) එළවළු |
| 2.2.2 අනුරාධපුර | (ii) පළතුරු |
| 2.2.3 හිඟුරක්ගොඩ | (iii) මාළු |
| 2.2.4 කන්කසන්තුරේ | (iv) මස් වර්ග / ශීතකල ආහාර |
| 2.2.5 මුලතිව් | (v) ලෙලිගසන ලද පොල් |
| 2.2.6 කිළිනොච්චිය | (vi) බිත්තර - කිකිළි |
| 2.2.7 දියතලාව | (vii) කිරි නිෂ්පාදන |
| 2.2.8 කොළඹ | (viii) C0 3 තණකොළ |

| C කාණ්ඩය - ප්‍රධාන ස්ථාන | |
|---|---|
| 2.3.1 පනාගොඩ | වියළි ආහාර අයිතමයන් (අයිතම් 180 ක්) |
| 2.3.2 අනුරාධපුර | |
| 2.3.3 හිඟුරක්ගොඩ | |
| 2.3.4 කන්කසන්තුරේ | |
| 2.3.5 මුලතිව් | |
| 2.3.6 කිළිනොච්චිය | |
| 2.3.7 දියතලාව | |
| 2.3.8 කොළඹ | |

එක් එක් ආහාර කාණ්ඩයෙහි ආහාර අයිතමයන්ට අදාළ පිරිවිතරයන් සහ අනෙකුත් විස්තර ලංසු ලේඛනය සමග ලබා දෙනු ලැබේ. (ඇමුණුම xiii)

සැපයුම් කරනු ලබන සියලුම ආහාර අයිතම නිසි ප්‍රමිතියෙන් යුතුව මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු විය යුතුය. නියමිත තත්ත්ව ප්‍රමිතීන් ලංසු ලේඛනයෙහි සහ එහි ඇමුණුම්හි දක්වා ඇති අතර, ආහාර සැපයුම් කිරීම 1980 හි අංක 26 දරන ආහාර පනත සංශෝධිත පරිදි සහ වරින් වර පනවන ලද රෙගුලාසි අනුව සිදු කළ යුතුය.

1.3 **එක් එක් කඳවුර / සේවා ස්ථාන සහ ආහාර කාණ්ඩයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීම**.

1.3.1 එක් එක් කඳවුර / සේවා ස්ථාන සහ එක් එක් ආහාර කාණ්ඩයන් පදනම් කරගෙන අදාළ එක් එක් කඳවුර සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතුය. සෑම ලංසුකරුවකු විසින්ම අදාළ කඳවුර / සේවා ස්ථානයට සැපයුම් කිරීමට බලාපොරොත්තු වන ආහාර කාණ්ඩයෙහි සියලුම ආහාර අයිතමයන්ට ලංසු තැබිය යුතුය. කිසියම් ලංසුකරුවකු ආහාර කාණ්ඩයක සියලුම ආහාර අයිතමයන්ට ලංසු නොතබන අවස්ථාවලදී එම ලංසුව ප්‍රතිචාර නොදක්වූ ලංසුවක් සේ සලකනු ලැබේ.

සෑම ලංසුකරුවකුහටම පහත කාණ්ඩ තුනක් ලෙස දක්වා ඇති ආකාරයට වෙන් වෙන් වශයෙන් ආහාර කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට සහ සැපයුම් ස්ථානයන් එකකට හෝ වැඩි ගණනකට ලංසු තැබිය හැක. ඒ අනුව ලංසුකරුගේ හැකියාව සහ සුදුසුකම් අනුව ලංසු ඇගයීම සිදු කෙරේ.

1.3.2 **'A' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා සියලුම අමු ආහාර ප්‍රවර්ගයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 85 ක් අඩංගු වන අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියන් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

1.3.3 **'B' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා ප්‍රවර්ගයේ අමු ආහාර අයිතමයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 64 ක් අඩංගු වන (කඳවුරු 08 X ප්‍රවර්ග 08 - ලංසු 64 ක්) අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, මිල ඇගයීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියන් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

1.3.4 **'C' කාණ්ඩය - එක් එක් කඳවුර සඳහා වියළි ආහාර අයිතමයන් සැපයීම**

මෙම කාණ්ඩයෙහි ලංසු 1440 ක් අඩංගු වන (කඳවුරු 08 X අයිතම් 180 = ලංසු 1440 ක්) අතර වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, මිල ඇගයීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියන් වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

02. තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එක් එක් අදාළ ගෙනැවිත් භාරදීමේ ස්ථාන / කඳවුරු සහ අනුඛණ්ඩ වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගකිව යුතුය. එක් එක් අදාළ ගෙනැවිත් භාරදිය යුතු ස්ථාන / කඳවුරු සහ අනුඛණ්ඩ පිළිබඳ විස්තර ලංසු ලේඛනයෙහි ඇතුළත් කර ඇත.

03. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය හරහා සිදු කරනු ලැබේ. විදේශීය සැපයුම්කරුවන් හට ලංසු ඉදිරිපත් කළ නොහැක.

04. ලංසු තැබීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු පුවත්පත් ලංසු දැන්වීම් පළ කරන දිනය වන විට දේශීය ව්‍යාපාර ලියාපදිංචියක් සහිත ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක්, නිෂ්පාදකයකු, සමාගමක් සහ සීමිත වගකීම් සහිත සමාගමක් අනෙකුත් වෙළඳ ආයතනයක් (අදාළ ආහාර අයිතම් සැපයීමේ නියුතු ස්ථිතියක්) විය යුතුය. ලංසුකරු අසාධු ලේඛනගත ලංසුකරුවකු නොවිය යුතුය.

05. පහත සඳහන් සුදුසුකම් ලංසුකරු විසින් සපුරාලිය යුතු අතර, අදාළ විස්තරයන් සනාථ කිරීම කළ හැකි ලේඛනයක්ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

5.1 **අමු ආහාර අයිතමයන්** සැපයීම සඳහා, ලංසුකරු විසින් කිලෝ මීටර් 100 ක් තුළ ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර / අධි ශීතකරණ සහ ශීත ට්‍රක් රථ (එම පහසුකම්හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට / කුලියට ලබා ගෙන තිබිය හැක) පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛනය සමග ලබා දෙනු ලැබේ.

5.2 **වියළි ආහාර අයිතමයන්** සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට / කුලියට ලබා ගෙන තිබිය හැක) පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛනය සමග ලබාදෙනු ලැබේ.

5.3. අවම වශයෙන් රුපියල් **මිලියන 5 ක** ද්‍රවශීල වත්කමක් තිබිය යුතුය.

5.4 ලංසුකරුගේ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් සපයනු ලබන අවම ණය සීමාව රුපියල් **මිලියන 5 ක්** විය යුතුය. (මෙම ටෙන්ඩරය සඳහා පමණි)

5.5 අවසාන වර්ෂ දෙකක සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රුපියල් **මිලියන 10 ක්** විය යුතු අතර, එය ලියාපදිංචි කර ඇති පිළිගත් විගණන ආයතනයක් විසින් විගණනය කළ මූල්‍ය ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතුය.

5.6 ලංසුකරු සඳහා අවසන් වර්ෂ 2 ක් තුළ රාජ්‍ය ආයතන වෙත හෝ වෙනත් ආයතනයක් වෙත ආහාර සැපයීම සම්බන්ධයෙන් තහවුරු කළ හැකි සතුටුදායක පළපුරුද්දක් තිබිය යුතුය.

ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් අවම සුදුසුකම් වන අතර, එම සුදුසුකම් මූලික ලංසු ඇගයීම් ක්‍රියාවලියේදී සාරාණුකූලව ප්‍රතිචාර දැක්වූ ලංසුවක් වශයෙන් තීරණය කිරීම සඳහා යොදගැනේ. නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ තීරණය ලංසු ලේඛනයෙහි දක්වා ඇති පරිදි පශ්චාත් ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් පසුව තීරණය කරනු ලැබේ.

6.0 **ලංසු ලේඛන නිකුත් කිරීම ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීමට අදාළ දිනය සහ වේලාව පහත පරිදි වේ.**

**ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය** : 2018.08.27
**ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව** : 2018.09.14 දින ප.ව. 4.00 දක්වා
**ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සහ වේලාව** : 2018.09.18 දින පෙ.ව. 9.00 දක්වා
**ලංසු විවෘත කරන අවසාන දිනය සහ වේලාව** :
**සියලුම අමු ප්‍රවර්ගයන්** - 2018.09.18 දින පෙ.ව. 9.00
**වර්ගීකරණය කරන ලද අමු ආහාර** - 2018.09.18 දින පෙ.ව. 9.00
**වියළි ආහාර** - 2018.09.18 දින පෙ.ව. 9.00

07. පූර්ව ලංසු රැස්වීම 2018 සැප්තැම්බර් 07 වන දින පෙරවරු 10.00 පැයට ප්‍රධාන ශ්‍රවණාගාරයේ 03 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, බාලදක්ෂ මාවත, කොළඹ 03 ලිපිනයෙහි පැවැත්වේ.

08. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ අධ්‍යක්ෂ සැපයුම් හා ප්‍රවාහන මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. ආපසු නොගෙවනු ලබන වටිනාකම 2016 ජුනි මස 17 වන දිනැති 06/2016 අංකය දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව තීරණය කරනු ලැබේ. (එක් එක් ලංසුවට අදළව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 16 හි සඳහන් ලිපිනයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත හැක)

09. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසු ලිපිලේඛන සමග ලබා දී ඇති ආකෘති පමණක් ලංසුකරුවන් විසින් භාවිතා කළ යුතුය. සියලුම ලංසු අනුපිටපත් සහිතව ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ ඡේද අංක 16 හි සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට ඉහත ඡේද 6 හි සඳහන් දිනය සහ වේලාවට ප්‍රථම බහාලිය යුතුය.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය 2019 මාර්තු මස 31 වන දින දක්වා විය යුතුය.

12. ඉදිරිපත් කරන ලංසුව සමග 2019 අප්‍රේල් 30 වන දින දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණ ඇපකරයක් ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය නමට ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකු විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නාලද කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණ ඇපකරයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. (අදළ බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වටිනාකම 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විස්තර කොට ඇති පරිදි එක් එක් ලංසුව සඳහා සඳහන් කොට ඇත.

13. සියලුම සැපයුම්, ලංසු ලිපිලේඛනයන්හි ඉල්ලා ඇති පරිදි සහ සඳහන් කර ඇති පරිදි නිෂ්පාදකගේ බලය පැවරීමේ සහතික ඉදිරිපත් කිරීමට යටත්වේ.

14. තාක්ෂණික ඇගයීම් කමිටුව / ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ මගපෙන්වීම මත ආරක්ෂක අමාත්‍යාංශයේ ආහාර ප්‍රසම්පාදන සහ ආවේක්ෂණ ඒකකයෙහි ඉල්ලීම පරිදි ලංසු ලිපිලේඛනයේ අතිරේක තොරතුරු සපයා ඇති අයිතමයන් සඳහා ලංසුකරු විසින් නියැදියන් (SAMPLE) ඉදිරිපත් කළ යුතුය. නියමිත කාල සීමාව තුළ නියැදියන් ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු ඇගයීම සඳහා සලකා නොබලන අතර, ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. මේ සඳහා උනන්දුවක් දක්වනු ලබන සුදුසුකම් ලත් ලංසුකරුවන් වැඩි දුර තොරතුරු යුද්ධ හමුද මූලස්ථානයේ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකි අතර, 2018 අගෝස්තු 27 වෙනි දින සිට රාජකාරි දිනවල 0900 පැය සහ 1500 පැය අතර පහත 16 ඡේදයේ ලබාදී ඇති ලිපිනයේ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැක.

16. ඉහත සඳහන් කළ ලිපිනය නම්,

**අවධානය** - **සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ**
**ලිපිනය** - **යුද්ධ හමුදාපති**
**යුද්ධ හමුදා මූලස්ථානය, දකුණු පර්ෂදය, ගාලු මුවදොර ටෙරසය, කොළඹ 03.**
**දුරකථන අංකය** - **0112302569, 0112302568**
**ෆැක්ස්** - **0112302569**
**ඊමේල්** - **dtesandt@army.lk**

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**(ත්‍රිවිධ හමුදාවන් සඳහා අමු ආහාර සහ වියළි සලාක ප්‍රසම්පාදනය),**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**21/08/2018**